සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

| | | |
|---|---|---|
| පෙරදිග සංගීතය I<br>கீழைத்தேய சங்கீதம் I<br>Oriental Music I | 54 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>*Two hours* |

විභාග අංකය : ...............................

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා**

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 01 | 1 - 5 | |
| 02 | 6 - 15 | |
| 03 | 16 - 24 | |
| 04 | 25 - 37 | |
| 05 | 38 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**උපදෙස්:**
※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.

- අංක **1** සිට **30** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ ඉතා ම ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ** ලියන්න.

**1.** සගරිගසරි, රිමගමරිග ස්වර රටාවේ අවරෝහණ ස්වරූපයේ ආරම්භක පියවර තෝරන්න.
(1) ස්නිස්ධස්නි (2) ස්ධනිධස්නි (3) ස්ධනිධනිස්
(4) ස්ධනිස්ධනි (5) ස්නිස්ධනිස් (......)

**2.** ශුද්ධ ස්වර පමණක් යෙදෙන රාග යුගලය තෝරන්න.
(1) හංසධ්වනි - දේස් (2) දේස් - තිලක්කාමෝද්
(3) තිලක්කාමෝද් - කාලිංගඩා (4) කාලිංගඩා - හංසධ්වනි
(5) හංසධ්වනි - තිලක්කාමෝද් (......)

**3.** නිර්දේශිත රාග විස්තර අනුව, රාග අවරෝහණය පිළිබඳ සැලකිල්ලට ගැනීමේදී උච්ඡ ෂඩ්ජයට පසුව ඒ සමගම නිෂාදය **නොයෙදෙන** රාගය තෝරන්න.
(1) දේස් (2) තිලක්කාමෝද් (3) ජයජයවන්ති
(4) භෛරව (5) හංසධ්වනි (......)

**4.** පංචමය ආගන්තුක හෝ විවාදී ස්වරයක් ලෙස භාවිත වන රාගය කුමක් ද?
(1) ආසාවරී (2) මාල්කෞන්ස් (3) බාගේශ්‍රී
(4) ජයජයවන්ති (5) දේස් (......)

**5.** වාදී ස්වරය සමාන ලෙස යෙදෙන රාග පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ජෞන්පුරී, කාලිංගඩා, භෛරව (2) භෛරව, කාලිංගඩා, ආසාවරී
(3) ආසාවරී, භෛරව, ජෞන්පුරී (4) ජෞන්පුරී, භෛරව, කාලිංගඩා
(5) කාලිංගඩා, ජෞන්පුරී, ආසාවරී (......)

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki



6. බමාජ් ථාටයට අයත් රාග යුගලය සඳහන් වරණය තෝරන්න.
   (1) දේස් - මාල්කෞන්ස්
   (2) මාල්කෞන්ස් - තිලක්කාමෝද්
   (3) තිලක්කාමෝද් - ජයජයවන්ති
   (4) ජයජයවන්ති - ජෞන්පුරි
   (5) ජෞන්පුරි - දේස් (......)

7. හංසධ්වනි රාගය බිලාවල් ථාටයට අයත්වන බව සඳහන් වුවද, යෙදෙන රාග සංගති අනුව එම රාගය වර්ගීකරණය කළ හැකි ථාටයකි,
   (1) කල්‍යාණ.
   (2) පූර්වි.
   (3) මාර්වා.
   (4) බමාජ්.
   (5) කාෆි. (......)

8. අ.පො.ස. උසස් පෙළ සංගීතය විෂයයට අදාළව භාරතීය, අපරදිග, චීන, ගැමිලැන් සහ මැද පෙරදිග වශයෙන් නම්කර හඳුන්වා දී ඇත්තේ,
   (1) සංගීත සම්ප්‍රදායයන් පහකි.
   (2) සංගීත පද්ධති පහකි.
   (3) සංගීත ශෛලීන් පහකි.
   (4) සංගීත යුග පහකි.
   (5) සංගීත ආකෘතීන් පහකි. (......)

9. උත්තර භාරතීය සංගීතයට ආවේණික ගායන ශෛලීන් පමණක් සඳහන් වරණය කුමක් ද?
   (1) පදම්, තිල්ලානා, වර්ණම්
   (2) වර්ණම්, ඛ්‍යාල්, ධමාර්
   (3) ධමාර්, තිල්ලානා, ධ්‍රැපද්
   (4) ධ්‍රැපද්, තරාණා, චතුරංග
   (5) චතුරංග, ඛ්‍යාල්, පදම් (......)

10. හින්දුස්ථානී සහ කර්ණාටක සංගීත ක්‍රම දෙකටම **පොදු නොවන** කරුණ තෝරන්න.
    (1) ථාට/මේල ක්‍රමය අනුව රාග වර්ගීකරණය සිදුවීම
    (2) ගමක්, මීන්ඩ් ශිල්පක්‍රම භාවිත වීම
    (3) ආවේනික ගායන ශෛලීන්ගෙන් යුක්ත වීම
    (4) ගායන ප්‍රබන්ධ සඳහා හින්දි, උර්දු භාෂා භාවිත වීම
    (5) ආවේණික තාල පද්ධතියකින් යුතුවීම (......)

11. තිහායි සහිත අවනද්ධාක්ෂර පද කොටසක් තෙවරක් වාදනය කර සමග්‍රහයෙන් අවසන් වනුයේ,
    (1) මුඛඩා ය.
    (2) ගත් ය.
    (3) චක්‍රදාර් ය.
    (4) ලෙහෙරා ය.
    (5) පරන් ය. (......)

12. ත්‍රිතාල් ඨේකාවේ යෙදෙන අවනද්ධ අක්ෂර පමණක් පෙන්නුම් කෙරෙන වෙනත් තාලයකි,
    (1) දීප්චන්දි.
    (2) කෙහෙර්වා.
    (3) ඣප් තාල්.
    (4) තිලවඩා.
    (5) ධමාර්. (......)

13. ඨේකාවකට හිමි සම්පූර්ණ මාත්‍රා සංඛ්‍යාව 12, 14, 16 වශයෙන් යෙදෙන තාල තුන පිළිවෙලින් දැක්වෙන වරණය තෝරන්න.
    (1) ඒක්තාල්, ත්‍රිතාල්, දීප්චන්දි
    (2) තිලවඩා, ඒක්තාල්, ධමාර්
    (3) ධමාර්, චෞතාල්, ත්‍රිතාල්
    (4) චෞතාල්, ධමාර්, තිලවඩා
    (5) ඒක්තාල්, තිලවඩා, දීප්චන්දි (......)

14. හමක් යොදා තිබීම, පර්දා සහිත වීම, අනුතත්වලින් යුතු වීම යන ලක්ෂණ තුන අතුරෙන් ඕනෑම ලක්ෂණ දෙකක් පමණක් දක්නට ලැබෙන සංගීත භාණ්ඩ දෙක තෝරන්න.
    (1) සිතාර් - එස්රාජ්
    (2) සිතාර් - වයලීන්
    (3) වයලීන් - එස්රාජ්
    (4) එස්රාජ් - සාරංගි
    (5) සාරංගි - සිතාර් (......)

15. "සූත්" නැමැති ශිල්පක්‍රමයෙහි නාදෝත්පාදන විධියම අනුගමනය කෙරෙන ශිල්පක්‍රමයකි,
    (1) මීන්ඩ්.
    (2) ගමක්.
    (3) ආන්දෝලිත.
    (4) කන්.
    (5) මූර්කි. (......)

7249

● අංක **16** සිට **18** දක්වා වූ ප්‍රශ්නවලට පිළිතුරු තේරීම සඳහා පහත සඳහන් රාගධාරී මධ්‍යලය ගත් වාදනයේ ස්ථායි කොටසෙහි ස්වර ප්‍රස්තාරය ඇසුරු කරගන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| ^මරි – | ම⁀ප | නි සං | ‿රිං ගු̱ං‿ ‿රිං සං‿ | ‿නි̱ ධ‿ ‿පම‿ | ‿ගරි‿ ‿ගස‿ |
| x | 0 | 2 | 0 | 3 | 4 |

**16.** ඉහත ස්වර ප්‍රස්තාරයෙන් හඳුනාගත හැකි රාගය සහ තාලය වන්නේ පිළිවෙලින්,
(1) තිලක්කාමෝද් - චෞතාල් ය. (2) දේස් - චෞතාල් ය.
(3) දේස් - ජප්තාල් ය. (4) තිලක්කාමෝද් - ඒක්තාල් ය.
(5) දේස් - ඒක්තාල් ය. (......)

**17.** රාගයට අදාළව, ස්වර ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරෙන වක්‍ර ස්වරය සහ එය යෙදී ඇති විභාගය කුමක් ද?
(1) ඍෂභය - පළමු විභාගය (2) ඍෂභය - හයවන විභාගය
(3) ගාන්ධාරය - හයවන විභාගය (4) උච්ඡ කෝමල ගාන්ධාරය - සිව්වන විභාගය
(5) උච්ඡ ඍෂභය - සිව්වන විභාගය (......)

**18.** අදාළ රාගයට අනුකූලව ස්වර ප්‍රස්තාරයේ යෙදී ඇති විවාදි ස්වරය තෝරන්න.
(1) ශුද්ධ ඍෂභය (2) කෝමල නිෂාදය
(3) උච්ච කෝමල ගාන්ධාරය (4) ශුද්ධ නිෂාදය
(5) ශුද්ධ ගාන්ධාරය (......)

**19.** ඛ්‍යාල් ගායනයේදී භාවිත **නොවන** ආලාප විශේෂයකි,
(1) බෝල් ආලාප්. (2) මධ්‍ය ආලාප්. (3) පූර්ව ආලාප්.
(4) ජෝඩ් ආලාප්. (5) බඩත් ආලාප්. (......)

**20.** භාරතීය සංගීතයේ ප්‍රභවයට හා වර්ධනයට පද්‍ය ප්‍රබන්ධයන්හි බලපෑම සනාථ කිරීම සඳහා දැක්විය හැකි ලිඛිත ග්‍රන්ථයක් වන්නේ,
(1) ගීතගෝවින්ද (2) ක්‍රමික්පුස්තක්මාලිකා
(3) සංගීතරත්නාකර (4) නාට්‍යශාස්ත්‍ර
(5) චතුර්දන්ඩිප්‍රකාශිකා (......)

**21.** පහත දැක්වෙන ගී පාද අතුරෙන් දීර්ඝ යති යෙදෙන, ඒකල ගායනයට වඩාත් ම ගැලපෙන ගී පාදය තෝරන්න.
(1) උදයට පායන ඉරු දෙවියන්ටයි
(2) ඉපල් පිටින් ගහන අව්ව පිටට ඉහිරවන්නේ
(3) පෙර බලලා පැදගෙන යන ඔරුව පිට
(4) දොඩම් කපාලා ඇඹුල් තනාලා නාන්න යනහැටි බලන් කලූ
(5) අහසට පිඹිනා එරන් කළේයා (......)

**22.** ගැමි සමාජයේ සාමූහික බව දනවන, කාන්තාවන්ටම සුවිශේෂී වූ ගී විශේෂය තෝරන්න.
(1) කමත් ගී (2) දැල් ගී
(3) ගැල් ගී (4) නෙළුම් ගී
(5) ලී කෙළි ගී (......)

**23.** පහත දැක්වෙන ගී පාද අතුරෙන් සදැස්මත් ගණන මාත්‍රා 20 ක් වන ගී පාදය කුමක් ද?
(1) මල්පිපී සුවඳයි සමනලුන් පැණි බොයි
(2) මද සුළඟ අප සැමට සුවයක් දෙයි
(3) වැහි බින්දු වැටී ගස්වල පිනි බිංදු නටනවා
(4) ඔරුව පදිනවා සීපද කියවෙනවා
(5) මුළු ලොව සිත් සනසා හද තුළ ගුණ පැතිරේ (......)

**24.** අන්‍යෝන්‍ය සම්බන්ධතාවය සහ කරන කාර්යයේ විශ්වාසවන්ත බව තහවුරු කෙරෙන මෙහෙ ගී විශේෂයට අයත් ගී පාදය තෝරන්න.
(1) දඩි බිඩි ගගා කරනා වැඩ රට වටියේ
(2) කලුගල් තලාල යි පාරට දමන්නේ
(3) වෙල්යායක ගොන් දෙන්නෙක් කකා උනී
(4) තව තවා බඹරු පිස පිස දමනකොට
(5) මලේ මලේ අර නාමල නෙලා වරෙන් (......)

Past Papers Wiki



25. "තානාලංකාර" ස්වරූපයේ ගායන අංග ඇතුළත්ව නිර්මාණය වී ඇති නූර්ති ගීතය තෝරන්න.
(1) සුවඳපත්ම ඕලු ආදී
(2) දන්න වංහුං අප කන්නසාමි
(3) අඹ දඹ නාරං කෙසෙල් දෙල්
(4) සෝබමාන දේවපුරා
(5) වාසනා දිනේකි මේක (......)

26. නාඩගම් හා සම්බන්ධයෙන් **වැරදි ප්‍රකාශය** ඇතුළත් වරණය තෝරන්න.
(1) දෙමළ නාඩගම් ගී තනුවලට සිංහල පදරචනා යොදාගෙන ඇති අවස්ථා ද ඇත.
(2) කතෝලික ගීතිකාවන් හි නාදමාලා ඇසුරු කරගත් නාඩගම් ද නිර්මාණය වී ඇත.
(3) දක්ෂිණ භාරතීය සංගීතය ඇසුරින් නාඩගම් සංගීතය නිර්මාණය වී ඇති බව පිළිගත් මතයකි.
(4) නාඩගම් නිර්මාණය සඳහා තෙරුකුත්තු (වීදි නාට්‍ය) ආභාසය ලබා ඇති බව සඳහන් වේ.
(5) නාඩගම් ගීත ස්ථායි, අන්තරා වශයෙන් පැහැදිලිව කොටස් දෙකකට වෙන්කර දැක්වේ. (......)

27. නීතිඥ චාර්ල්ස් ඩයස් මහතා නිෂ්පාදනය කළ නූර්ති නාට්‍යයක නම ඇතුළත් වරණය තෝරන්න.
(1) රාමායනය
(2) පද්මාවතී
(3) රොලීනා
(4) සකුන්තලා
(5) වෙස්සන්තර (......)

28. පහත දැක්වෙන අපරදිග මේජර් ස්කේල (Major Scales) අතරින් ෆ්ලැට් නෝට්ස් (Flat Notes) තුනක් පමණක් යෙදෙන ස්කේලය (Scale) තෝරන්න.
(1) $B^b$ Major
(2) $E^b$ Major
(3) F Major
(4) C Major
(5) $A^b$ Major (......)

29. අපරදිග සංගීතයේ C මේජර් ස්වර සංඝාතයට (C Major Chord) අදාළවන රිලේටිව් මයිනර් ස්වර සංඝාතය (Relative Minor Chord) තෝරන්න.
(1) A Minor
(2) C Minor
(3) D Minor
(4) E Minor
(5) G Minor (......)

30. අපරදිග සංගීතයේ C Minor$^{7th}$ ($C^{m7}$) ස්වර සංඝාතයට (Chord) අදාළ ස්වර නිවැරදිව ඇතුළත් වරණය තෝරන්න.
(1) C $E^b$ G $A^b$
(2) C $E^b$ G A
(3) C $E^b$ G $B^b$
(4) C $E^b$ G B
(5) C $E^b$ G D (......)

● අංක **31** සිට **50** තෙක් ප්‍රශ්නවල ඇති හිස්තැන් සඳහා සුදුසුම පිළිතුරු යොදන්න.

31. ඛ්‍යාල් ශෛලීය ගායන, වාදන ප්‍රබන්ධයන්හි සමස්ථානයට ප්‍රවේශ වීමට පෙර කොටස .................... නමින් හඳුන්වනු ලබන අතර, ගත් වාදනයේදී තානාලංකාර වැයීමෙන් පසුව විවිධත්වයෙන් යුතුව දෘත ලයෙන් ඉදිරිපත් කරනු ලබන .................... නම් වූ රිද්මයානුකූල වාදන අංගයෙන් වාදනය අවසන් කරනු ලබයි.

32. ඛ්‍යාල් ගීපද උච්චාරණයෙන් ගයනු ලබන තානාලංකාර .................... තාන් ලෙස ද, ස්වර උච්චාරණයෙන් ගයනු ලබන තානාලංකාර .................... තාන් ලෙස ද සාමාන්‍ය ව්‍යවහාරයේ පවතී.

33. ධ්‍රැපද් ගීත ආකෘතිය ස්ථායි, ...................., සංචාරි, .................... යනුවෙන් කොටස් හතරකින් යුතුව ගොඩනැගී ඇත.

34. ධ්‍රැපද්, ධමාර් ගායන ශෛලීන් සඳහා සහාය තාල වාදනය .................... නම් වාද්‍ය භාණ්ඩයෙන් සිදුකෙරෙන අතර, නක්කරා නම් අවනද්ධ වාද්‍ය භාණ්ඩයෙන් සහාය තාල වාදනය සිදුකෙරෙනුයේ .................... නම් වූ ස්වරවාද්‍ය භාණ්ඩය වාදනයේදී ය.

35. පංකජ් උදාස්, .................... නම් වූ ගායන ශෛලියට සුප්‍රසිද්ධ වන අතර මීරාබායි, .................... ගී සඳහා සුප්‍රසිද්ධව ඇත.

36. ජෞන්පුරි, දේස්, .................... සහ .................... යනාදී නිර්දේශිත රාගවල රාග සංගතීන්හි කෝමල ගාන්ධාර ස්වරය පෙන්නුම් කෙරෙනුයේ අවරෝහණ ස්වරූපයෙන් පමණි.

37. "ධ̲ප, ගමග, රි̲ස" වශයෙන් .................... රාගයේ සංගති යෙදෙන අතර, "ධ̲ප ම ගම, රි̲ස" වශයෙන් සංගති යෙදෙනුයේ .................... රාගයේ ය.

[පස්වැනි පිටුව බලන්න.

- අංක **38** සිට **40** තෙක් ප්‍රශ්න සඳහා පහත සඳහන් ඡේදය කියවා ඒ ඇසුරෙන් පිළිතුරු සපයන්න.

හවානි විසින් සිය සංගීත භාණ්ඩයෙහි එක් එක් ස්වරයට තත් තුන බැගින්, 'ක්වාලම්' නමැති උපකරණයෙන් වයමින් සුසර කරගෙන, අ.පො.ස. උසස්පෙළට නිර්දේශිත රාගයකින් ගත් වාදනයක් ඉදිරිපත් කරමින්, | ස̇– (x) නිධ පම ගරි සරි මප ධ– සරි මප ධ– සරි මප | ධ (x) වශයෙන් තානාලංකාරයක් වයා, සමස්ථානයෙන් ගත් වාදනය අවසන් කර, ජලා වාදනය සඳහා ප්‍රවේශ විය.

**38.** හවානි විසින් ………………………… නම් සංගීත භාණ්ඩයෙන් අවසානයේ වැයූ තානාලංකාරයෙහි "සරිමපධ" වශයෙන් කිහිපවතාවක් යෙදෙන කොටස හඳුන්වනුයේ ……………… නම් වූ පාරිභාෂිත වචනයෙනි.

**39.** ඇය විසින් වාදනය කරන ලද්දේ ……………… රාගය හෝ ……………… රාගය හෝ විය යුතු ය.

**40.** ……………… ලයෙන් ඉදිරිපත් කරන ලද ගත් වාදනය සඳහා වයන ලද්දේ ……………… නමැති තාලය යි.

**41.** නිර්දේශිත රාග අතරින් ……………… රාගය සහ ……………… රාගය සඳහා තාම්පුරාව සුසර කරනු ලබන්නේ "මු ස ස ස" ස්වර පිළිවෙල අනුව ය.

**42.** උඩරට ගැටබෙර පද සහ ගී පද ගැයෙන නිර්දේශිත ගීත විශේෂය ………………………… නමින් හඳුන්වනු ලබන අතර උඩරට වන්නම් ගායනයේදී ……………… නම් වූ කොටස ගැයීමෙන් පසුව කවිය, ගායනය සිදුකෙරේ.

**43.** උඩරට ……………………… නම් ශාන්තිකර්මයෙහි ඇතුළත් කුවේනි අස්නෙ කවි, ……………… ශෛලියෙන් ප්‍රබන්ධ කර ඇත.

**44.** සම්පූර්ණ මාත්‍රා සංඛ්‍යාව 07 කින් යුක්තවන දෙතිතෙහි නම …………………………… දෙතිත වන අතර, එම මාත්‍රා සංඛ්‍යාවම පෙන්නුම් කෙරෙන තුන්තිත, ……………………… තුන්තිත නමින් හැඳින් වේ.

**45.** මාල්කෞන්ස් රාගය ආශ්‍රයෙන් නිර්මාණය වී ඇති "මන තරපත හරි දර්ශන කො ආජ" වශයෙන් ගී පද යෙදෙන ගීතය ……………… නම් හිංදි චිත්‍රපටයෙහි ඇතුළත් වන අතර, එම චිත්‍රපටයෙහි ම ඇතුලත් "තු ගංගා කි මෞජු මෙෙ" වශයෙන් ගී පද යෙදෙන ගීතය නිර්මාණය වී ඇත්තේ ……………… රාගය ආශ්‍රයෙනි.

**46.** සුනිල් සාන්ත ශූරීන්ගේ ගී තනු හා නාද රටාවන්ගෙන් හැඩ වූ රේඛාව චිත්‍රපටයේ පසුබිම් සංගීතය සඳහා ………………………… සහ ………………………… නම් සංගීතඥයින් දායක වී ඇත.

**47.** වයලීනයේ තත් 4 කර්ණාටක ක්‍රමයට අනුව සුසර කරනුයේ …., …., …., …. යන ස්වර පිළිවෙල අනුව වන නමුත්, අපරදිග ක්‍රමය අනුව සුසර කරනුයේ …., …., …., …. යන ස්වර පිළිවෙලට අනුව ය.

**48.** බටහිර සංගීත භාණ්ඩ වාදනය කළ හැකි ස්වර පරාසයන් අනුව, පිකලෝ නම් සංගීත භාණ්ඩය ……………… හඬ තලයටද, ටියුබා නම් සංගීත භාණ්ඩය ……………… හඬ තලයටද අයත් වේ.

**49.** නාදයක් මිනිස් මොළය කරා ගමන් කරන්නේ බාහිර ශ්‍රවණ නාලය ඔස්සේ කර්ණපටහ පටල කම්පනය කරමින් නිසාතිය, ……………… සහ ……………… යන අස්ථිවල චලනයෙනි.

**50.** වර්ෂ 1952 දී රජයේ සංගීත විද්‍යාලයේ ආරම්භක අධිපති ධුරය …………………………… මහතා විසින් හොබවන ලද අතර වර්ෂ 1972 දී ගිරාගම ගුරු විදුහල සෞන්දර්ය ගුරු විද්‍යාලයක් ලෙස පරිවර්තනය වීමෙන් පසු එහි ප්‍රථම විදුහල්පති ධුරය හොබවන ලද්දේ …………………………… මහතා විසිනි.

* * *

AL/2026/54/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

| | | |
|---|---|---|
| **පෙරදිග සංගීතය** | **II** | **54 S II** |
| கீழைத்தேய சங்கீதம் | **II** | |
| Oriental Music | **II** | |

| | | |
|---|---|---|
| *පැය තුනයි* | **අමතර කියවීම් කාලය** | **- මිනිත්තු 10 යි** |
| *மூன்று மணித்தியாலம்* | மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| *Three hours* | Additional Reading Time | - 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

※ **I** කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, **II** කොටසින් **එක්** ප්‍රශ්නයකට ද, **III** කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, වශයෙන් ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න. (සෑම ප්‍රශ්නයකට ම **ලකුණු 20** බැගින් ලැබේ.)

## I කොටස

**1.** පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග හතරකට අයත් ස්වර සංගතීන් ය.

A - රි ම ප ධ̲ ස්̇

B - රි ම ප නි ස්̇

C - රි ම ප ධ̲ නි̲ ස්̇

D - රි ම ප ධ ම ප ස්̇

(i) ඉහත A, B, C හා D යටතෙහි සඳහන් ස්වර අනුව අදාළ නිර්දේශිත රාග හතර හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂර ඉදිරියෙන් ලියා දක්වන්න. (ලකුණු 04 යි.)

(ii) එම රාග අතරින් ෂාඩව-සම්පූර්ණ ජාතියට අයත් රාග **දෙක** නම් කර එම රාග ගැයීමට නියමිත ගානසම දෙක අදාළ රාග දෙකෙහි නම් ඉදිරියෙන් ලියන්න. (ලකුණු 04 යි.)

(iii) ඉහත රාග අතරින් රාග අවරෝහණයන් හි වක්‍රස්වර යෙදෙන රාග **දෙක** නම් කර, එම වක්‍රස්වර දෙක ද අදාළ රාගවල නම් ඉදිරියෙන් ලියන්න. (ලකුණු 04 යි.)

(iv) ඉහත A සහ B හි දැක්වෙන ස්වරවලින් පිළිබිඹුවන රාග දෙකෙන් **කැමති රාගයකට** අදාළ ඛ්‍යාල් මධ්‍යලය ගීතයක හෝ ගත් වාදිතයක හෝ ස්ථායි කොටස තාල ආවර්ත දෙකක් සම්පූර්ණ වන සේ, තාල සංකේත ද සහිතව ස්වර ප්‍රස්තාර කර, මාත්‍රා 08 කට **නොඅඩුවන** සේ තානාලංකාර තුනක් ලියන්න. (ලකුණු 08 යි.)

**2. බාගේශ්‍රී, ජයජයවන්ති යන රාග දෙකෙන්,**

(i) ඔබ **කැමති රාගයක** ඛ්‍යාල් මධ්‍යලය ගීතයෙහි හෝ ගත් වාදිතයෙහි හෝ ස්ථායි කොටස තාල ආවර්ත දෙකක් සම්පූර්ණ වන සේ තාල සංකේත ද සහිතව ස්වර ප්‍රස්තාර කර, තිහායි කොටසකින් අවසන් වන ආකාරයට තානාලංකාරයක් මාත්‍රා 08 කට **නොඅඩුවන** සේ, ලියා දක්වන්න. (ලකුණු 07 යි.)

(ii) ජයජයවන්ති රාගයට අදාළව රාගාශ්‍රිත පල්ටාවක් මධ්‍ය ෂඩ්ජ ස්වරයේ සිට උච්ඡ ෂඩ්ජ ස්වරය තෙක් ගොඩනංවා ලියා දක්වන්න. (ලකුණු 04 යි.)

(iii) බාගේශ්‍රී රාගයට අදාළව අවම වශයෙන් රාග සංගති තුනක්වත් ආවරණය වන ලෙස ආලාප කොටසක් ස්වර 30 කට **නොඅඩුවන** සේ ලියන්න. (ලකුණු 05 යි.)

(iv) ත්‍රිතාල්, පංජාබි සහ තිලවඩා යනාදි තාල තුනෙහි සමානතා **හතරක්** නිදසුන් සහිතව ලියන්න. (ලකුණු 04 යි.)

[දෙවැනි පිටුව බලන්න.

**3.** පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග දෙකක රාග ජාතිය සහ ධෛවත ස්වරය හා සම්බන්ධයෙන් සිදුකර ඇති සංසන්දනාත්මක ප්‍රකාශයකි.

"එක් රාගයක ජාතිය ඖඩව වන අතර ධෛවත ස්වරය වර්ජිත වේ. අනෙක් රාගයෙහි ජාතිය සම්පූර්ණ වන අතර ධෛවත ස්වරය කෝමල මෙන් ම ආන්දෝලිත ද වේ."

(i) ඉහත ප්‍රකාශනයෙන් හඳුනාගත හැකි රාග දෙක නම්කර එම රාග දෙකෙහි වාදි සහ සංවාදි ස්වර පිළිවෙලින්, රාගවල නම් ඉදිරියෙන් ලියා දක්වන්න. (ලකුණු 04 යි.)

(ii) ප්‍රකාශනයෙහි සඳහන් වන ඖඩව ජාති රාගයෙන් ස්වර රචනාවක්, රාගය මැනවින් ප්‍රකට වන ලෙස නිර්මාණය කර, දීප්චන්දි තාලයෙහි ආවර්ත දෙකක් සම්පූර්ණ වන ලෙස ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි.)

(iii) ප්‍රකාශනයෙහි සඳහන් වන සම්පූර්ණ ජාති රාගයට සමප්‍රකෘති වන රාගය නම්කර එම සමප්‍රකෘති රාග දෙක අතර **සමානතා තුනක්** සහ **අසමානතා දෙකක්** නිදසුන් ද සහිතව පෙන්වා දෙන්න. (ලකුණු 06 යි.)

(iv) චෞතාල් සහ ඒක්තාල් යනාදී තාල දෙකෙන් **එක් තාලයක** ඨේකාව නියමිත තාල සංකේත ද සහිතව සමලයෙන් යුතුව ප්‍රස්තාර කර, එම තාල දෙක සම්බන්ධයෙන් අසමානතා **දෙකක්** නිදසුන් සහිතව ලියා දක්වන්න. (ලකුණු 04 යි.)

## II කොටස

**4.** (i) සහාය වාදනය සඳහා ගැටබෙරය යොදාගත හැකි සෙ‍ගී වර්ග **පහක්** නම් කරන්න. (ලකුණු 05 යි.)

(ii) (අ) නිර්දේශිත වැලපුම් ගී අතුරෙන් ආඝාතාත්මකව ගායනය කරනු ලබන වැලපුම් ගීයක මුල් ගී පාදයක් සහ අනාඝාතාත්මකව ගායනය කරනු ලබන වැලපුම් ගීයක මුල් ගී පාදයක් බැගින් වෙන වෙනම ලියා දක්වන්න.

(ආ) ආඝාතාත්මක සහ අනාඝාතාත්මක වැලපුම් ගීවල සමානතා **තුනක්** සහ අසමානතා **දෙකක්** ලියන්න. (ලකුණු 07 යි.)

(iii) වැදි දරු නැලවිලි ගීතයක, ගී පාද දෙකක් පද ප්‍රස්තාරකර, එහි සුවිශේෂ ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි.)

(iv) මෙරට ගැමි ගී තුලින් පිළිබිඹු වන වටිනාකම්, පහත කරුණු මූලික කරගනිමින් නිදසුනක් බැගින් දක්වමින් අගයන්න.

(අ) සන්නිවේදන කාර්යයක් ලෙස යොදා ගැනීම.
(ආ) සාරධර්ම අගයයන් මතුකර දැක්වීම. (ලකුණු 04 යි.)

**5.** (i) රංග සම්ප්‍රදායන් හතරකට අදාළව සකසා ඇති, පහත වගුවෙහි (a) සිට (h) තෙක් හිස්තැන්වලට ගැළපෙන පිළිතුරු අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග ලියන්න.

| රංග සම්ප්‍රදායන් | ආභාසිත සංගීත සම්ප්‍රදායන් | ආවේණික තාල වාද්‍ය භාණ්ඩ | ආරම්භක යුගවල රඟ දැක්වූ රගමඩල හැඳින් වූ නාමයකි. |
|---|---|---|---|
| නූර්ති | හින්දුස්තානි රාගධාරී | (a) .......................... | (b) ............................ |
| නාඩගම් | (c) ............................ | (d) .......................... | කරළිය |
| සොකරි | උඩරට ශාන්තිකර්ම ආශ්‍රිත | (e) .......................... | (f) ........................... |
| කෝලම් | (g) ............................ | යක්බෙරය | (h) ........................... |

(ලකුණු 04 යි.)

(ii) පහත දී ඇති ශීර්ෂ තුන ආවරණය වන පරිදි සොකරි සහ කෝලම් රංග සම්ප්‍රදායයන් දෙකට අදාළව, සංසන්දනාත්මක කෙටි විස්තරයක් කරන්න.
(අ) කථා ප්‍රවෘත්තිය (ආ) රංග වස්ත්‍රාභරණ (ඉ) චරිත (ලකුණු 06 යි.)

(iii) මහනුවර යුගයේ රාජසභාවට අයත්වන සංගීත, නැටුම් යන අංගවලින් සැදුන කවිකාරමඩුව පිළිබඳ සුවිශේෂී කරුණු **පහක්** ඇතුළත් වන සේ විස්තරයක් කරන්න. (ලකුණු 06 යි.)

(iv) උරුට්ටුව සහිත නාඩගම් ගීතයක් ඇතුළත් නිර්දේශිත නාඩගමක් නම්කර, අදාළ ගීතයෙහි උරුට්ටුවට අදාළ ගී පද කොටස ලියා දක්වා, එම කොටස ගැයෙන රිද්ම රටාව ද නම් කරන්න. (ලකුණු 04 යි.)

[තුන්වැනි පිටුව බලන්න.

Past Papers Wiki

## III කොටස

6. (i) පහත දැක්වෙන පෙරදිග සංගීත ස්වර ප්‍රස්තාරය අපරදිග සංගීත ක්‍රමය අනුව පෙරළා ප්‍රස්තාර කරන්න. මේ සඳහා සපයා ඇති සංගීතය පිළිබඳ අත්පිටපත (Music Manuscript) යොදා ගන්න. (පෙරදිග ෂඩ්ජ ස්වරය අපරදිග C ස්වරයට (C Note) සමාන ලෙස සලකා ප්‍රස්තාර කරන්න.)

| + ධ̣ස ස ග | - ග - ග | + මග රි ස | රි - රි - |
| + රිග ම ප | ම - - ම | + ගරි ස රි | ග - - - |

(ලකුණු 04 යි.)

(ii) ඉහත දැක්වෙන පෙරදිග සංගීත ස්වර ප්‍රස්තාරයට ගැලපෙන ලෙස කෝඩ්ස් (Chords) යොදමින් නැවත ප්‍රස්තාර කරන්න. එහිදී C, F, G, D$^m$, A$^m$ යන කෝඩ්ස්වලින් පමණක් අදාළ ලෙස තෝරා, කෝඩ්ස් සුදුසු පරිදි යොදන්න. (ලකුණු 04 යි.)

(iii) පහත දැක්වෙන අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ස්වර ප්‍රස්තාර ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරන්න. (අපරදිග සංගීතයේ C Note (ස්වරය) ෂඩ්ජ ස්වරයට සමාන ලෙස සලකන්න)





(ලකුණු 04 යි.)

(iv) (අ) පහත සඳහන් වගුවෙහි ① **තීරුවෙහි** සඳහන් ස්කේල්වලට (Scales) අදාළවන ප්‍රධාන ස්වර සංඝාත තුන (Principal Chords) වගුවෙහි ② **තීරුවෙහි** දැක්වෙන හිස්තැන් යටතෙහි යෙදෙන ආකාරයට පිළිතුරු පත්‍රයෙහි ලියා දක්වන්න. (උදාහරණය අනුගමනය කරන්න.)

| | ① තීරුව | ② තීරුව |
|---|---|---|
| උදා :- | C | C, F, G |
| | F | ...., ...., .... |
| | G | ...., ...., .... |
| | D | ...., ...., .... |
| | A | ...., ...., .... |

(ලකුණු 04 යි.)

(ආ) පහත අංක 1 සිට 3 තෙක් සඳහන් එක් එක් සිග්නේචරයන්ට (Key Sigantures) අදාළවන, මේජර් ස්කේල (Major Scales) සහ මයිනර් ස්කේල (Minor Scales), නියමිත සංකේත භාවිතයෙන් අදාළ රෝමානු අංක ඉදිරියෙන් පිළිවෙලින් පිළිතුරු පත්‍රයෙහි ලියන්න.(උදාහරණය අනුගමනය කරන්න.)

| | Key Signature | Major Scale | Minor Scale |
|---|---|---|---|
| උදා :- |  | B$^b$ | G$^m$ |
| 1. |  | C | (i) ............ |
| 2. |  | (ii) ............ | (iii) ............ |
| 3. |  | (iv) ............ | C$^m$ |

(ලකුණු 04 යි.)

[හතරවැනි පිටුව බලන්න.

PAST PAPERS WIKI
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**7.** (i) සිංහල චිත්‍රපට ගීත ඉතිහාසයෙහි 1957 සිට 1967 දක්වා කාලය තුළ (දෙවන යුගය) ස්වතන්ත්‍ර තනු නිර්මාණයේ යෙදුන සංගීත අධ්‍යක්ෂවරුන් සිවුදෙනෙකු නම් කර, ඔවුන් විසින් නිර්මාණය කරන ලද ගීත **හතරක** ආරම්භක පද පෙළ බැගින් අදාළ චිත්‍රපටයද නම්කර ඒ ඉදිරියෙන් ලියන්න. (ලකුණු 06 යි.)

(ii) රාගාශ්‍රිත සරල ගී වශයෙන් සලකනු ලබන හංසරාජිනී, කමලාසිනී, මාරම්බරී සහ හෝපලු වනපෙත යනාදී ලෙස පද යෙදෙන ගීත හතර සඳහා පදනම් කරගත් රාග සහ ගායකයින්ගේ නම් අදාළ ගීතවල නම් ඉදිරියෙන් ලියා දක්වන්න. (ලකුණු 04 යි.)

(iii) පහත සඳහන් බටහිර සංගීතඥයින්ගෙන් **දෙදෙනෙකු** තෝරාගෙන ඔවුන් විසින් සිදුකරන ලද සංගීත නිර්මාණ **දෙක** බැගින් අදාළ සංගීතඥයින්ගේ නම් ඉදිරියෙන්, සඳහන් කරන්න.

(අ) ලුඩ්විග් වැන් බීතෝවන් (ආ) ඇමඩියස් මොසාර්ට් (ඉ) සෙබස්තියන් බාක් (ලකුණු 04 යි.)

(iv) පහත වගුවෙහි ඇති හිස්තැන්වලට ගැලපෙන නිවැරදි කරුණු අදාළ අංකය සමග ලියන්න.

| **චිත්‍රපටය** | **ගීතය** | **සංගීත අධ්‍යක්ෂ** |
|---|---|---|
| බඹරු ඇවිත් | 1. ............................ | 2. ............................ |
| 3. ............................ | සිනිඳු සුදු මුතු තලාවේ | 4. ............................ |
| 5. ............................ | කටේ කිරි සුවඳ යන්නට | ආර්. මුත්තුසාමි |
| රන්මුතු දූව | ගලන ගඟකි ජීවිතේ | 6. ............................ |

(ලකුණු 06 යි.)

**8.** පහත සඳහන් (i) සිට (vi) තෙක් ප්‍රශ්න කොටස් අතුරෙන් **හතරක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.

(i) "සංගීත භාණ්ඩයන්හි හටගැනෙන තාක්ෂණික දෝෂ, හඬෙහි ගුණාත්මකභාවය රැකගැනීමට බාධාවක් වේ."

පහත සඳහන් සංගීත භාණ්ඩ අතුරෙන් **හතරක්** තෝරාගෙන ඒවායෙහි පොදු වශයෙන් ඇතිවිය හැකි තාක්ෂණික දෝෂයක් බැගින් පෙන්වා දෙමින්, ඉහත අදහස තහවුරු කරන්න.

- වයලීන්
- එස්රාජ්
- සිතාර්
- බටනලා
- තබ්ලා
- ගිටාර්

(ලකුණු 05 යි.)

(ii) රාගධාරී සංගීතයට අදාළව පහත ස්වර රචනාව ප්‍රස්තාර කර ඇත්තේ ෂඩ්ජ ස්වරය ප්‍රධාන ශ්‍රැතිය ලෙස සලකමිනි. ෂඩ්ජ භාවයෙන් පෙන්නුම් කෙරෙන එම ස්වර රචනාව මන්ද්‍ර කෝමල ධෛවතය ප්‍රධාන ශ්‍රැතිය ලෙස ගෙන (කෝමල ධෛවත භාවයෙන්) පරිවර්තනය කර ස්වර ප්‍රස්තාර කරන්න. ඔබ විසින් පරිවර්තනය කරන ලද ස්වර රචනාවෙන් පිළිබිඹුවන රාගයෙහි නම ලියන්න.

| | | | |
|---|---|---|---|
| ග රිග රි ස | – ධ̣ ස රි | ග – ප ග | ධ ප ග – |
| ග ප ධ ප | ස̇ ධ රි̇ ස̇ | ග̇ රි̇ ස̇ ධ | ප ධ ප ග |
| 0 | 3 | X | 2 |

(ලකුණු 05 යි.)

(iii) පහත සඳහන් ශාන්තිකර්ම සම්ප්‍රදායන් තුනෙන් කැමති සම්ප්‍රදායන් **දෙකක** ශාන්තිකර්ම ගීත පිළිබඳ, සමානතා දෙකක් සහ අසමානතා දෙකක් පෙන්නුම් කරමින් සංසන්දනාත්මකව විස්තර කරන්න.

- උඩරට ශාන්තිකර්ම
- පහතරට ශාන්තිකර්ම
- සබරගමු ශාන්තිකර්ම

(ලකුණු 05 යි.)

(iv) රාග ගානසමය තීරණය කිරීම පිළිබඳ පහත කරුණු **දෙකක්** කෙරෙහි අවධානය යොමුකරමින් නිදසුන් සහිත කෙටි විග්‍රහයක් කරන්න.

(a) රාගයන්හි යෙදෙන ස්වර විශේෂ කාණ්ඩ තුනෙහි බලපෑම

(b) අධ්වදර්ශක ස්වරයෙහි බලපෑම

(c) වාදි ස්වරයෙහි බලපෑම (ලකුණු 05 යි.)

(v) ත්‍රිතාලයට අදාළ

| X | 2 | 0 | 3 |
|---|---|---|---|
| ධා ධා තිරි කිට | ධා ධා තු නා | තා තා තිරි කිට | ධා ධා තු නා |

යනාදී කායදාවට අනුකූලවන ලෙස පල්ටා දෙකක් ගොඩනගා, තිහායි කොටසක් ද සමග ප්‍රස්තාර කරන්න. (ලකුණු 05 යි.)

(vi) සාර්ථක ගායනයක් ඉදිරිපත් කිරීම සඳහා නිවැරදි ඉරියව් පවත්වා ගැනීම සහ මූලික අභ්‍යාසයන්හි යෙදීම ප්‍රයෝජනවත් වන ආකාරය කරුණු **හතරක්** යටතේ පෙන්වා දෙන්න. (ලකුණු 05 යි.)

* * *

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library